# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1821/30 - 2013 ජූලි මස 31 වැනි බදාදා - 2013.07.31

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# III වැනි කොටස - ඉඩම්

## ඉඩම් රජයට ගැනීම පිළිබඳ දැන්වීම්

### 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : ඉප්‍රා/20 /17/එල්එල්ඒ/26/2008.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන ඉඩම්/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.

ලබා ගැනීමට බලාපොරොත්තුවන ඉඩමේ/පරවශතාවේ විස්තර :

බළන්ගොඩ-බණ්ඩාරවෙල මාර්ගය පුනරුත්ථාපනය කිරීමේ ව්‍යාපෘතිය සඳහා අමතර ඉඩම් අත්පත් කර ගැනීම.

සබරගමුව පළාතේ, රත්නපුර දිස්ත්‍රික්කයේ, ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ, කඩවත කෝරළේ සීලගම ග්‍රාම නිලධාරි වසමේ සීලගම ගමේ අ.ග.පි. 560 අතිරේක 6 කැබලි අංක 171 මුල්ලෙවත්ත සහ පුරාණෙවත්ත හේන නමැති ඩබ්. එම්. නිහාල් ප්‍රේමසිරි හිමිකම් කියන ප්‍රමාණය හෙක්ටයාර් 0.0437ක් වන ඉඩම් කැබැල්ල.

ඉහත සඳහන් ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලි වලින් බලයලත් අයවලුන් හෝ 2013.09.30 වැනි දින පූ.භා./9.30ට ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු යි.

තව ද, 2013.09.23 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයන් එකී ඉඩම/පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු යි.

ජේ. එල්. සී. කේ. ජයසිංහ,
ප්‍රාදේශීය ලේකම්,
ඉඹුල්පේ.

2013 ජූලි මස 24 වැනි දින,
ඉඹුල්පේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 560

---

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

යොමු අංකය : පීටීබී/එල්එන්ඩී/ඒසීකිව්යූI/7/10.

මහජන කටයුත්තක් සඳහා අවශ්‍ය පහත දැක්වෙන *ඉඩම/පරවශතාව ලබා ගැනීමට ආණ්ඩුව අදහස් කරන බැවි, 1964 අංක 28 දරන ඉඩම් අත්කර ගැනීමේ (සංශෝධන) පනතින් සංශෝධිත පරිදි ඉඩම් අත්කර ගැනීමේ පනතේ 7 වැනි වගන්තියේ (1) වැනි උපවගන්තිය යටතේ මෙයින් දැනුම් දී සිටිමි.



*මෙම ගැසට් පත්‍රය www.documents.gov.lk වෙබ් අඩවියෙන් බාගත කළ හැක.*

ලබා ගැනීමට බලාපොරොත්තුවන *ඉඩමේ/පරවශතාවේ විස්තර :

දකුණු පළාතේ මාතර දිස්ත්‍රික්කයේ පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හැව්ඕවිට ගමේ කොටගල ග්‍රාම නිලධාරි වසමේ පිහිටි සර්වේයර් ජනරාල් විසින් පිළියෙළ කර ලද පිඹුරු අංක 15 හා අතිරේක 2 පත්‍ර අංක 3 හා 2013.06.21 දිනැති අවසාන ගම් පිඹුරේ පෙන්නුම් කරන ප්‍රමාණයෙන් හෙක්ටයාර් 0.0034ක් පමණ වන නිපුනව්වාරි ගෙවත්ත පැලවත්ත සහ මිල්ලගහ කුඹුර යන ඉඩම් කැබලි 2 කට මායිම්ව :

**කැබලි අංක 98**

ඉඩමේ නම: නිපුනව්වාරි ගෙවත්ත පැලවත්ත සහ මිල්ලගහ කුඹුර; විස්තරය: විවෘත මුඩුබිම; මුල් හිමිකම් කියන අය: දංකොටුව ලියනගේ සුජීව පැලවත්ත, කොටගල, පිටබැද්දර; ප්‍රමාණය: හෙක්. 0.0017

**කැබලි අංක 99**

ඉඩමේ නම: නිපුනව්වාරි ගෙවත්ත පැලවත්ත සහ මිල්ලගහ කුඹුර; විස්තරය: විවෘත මුඩුබිම; මුල් හිමිකම් කියන අය: මුණසිංහ සේනානායක ප්‍රසන්න, පස්ගොඩගෙදර, හැව්ඕවිට, පිටබැද්දර; ප්‍රමාණය: හෙක්. 0.0017

ඉහත සඳහන් *ඉඩමට/පරවශතාවයට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලු දෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලයලත් අයවලුන් හෝ 2013.09.25 වැනි දින පූ. භා. 10.00 ට පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013.09.18 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත් එකී *ඉඩම/ පරවශතාවයට ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත් වන්දි මුදල හා ඒ මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

කේ. ජී. ආර්. ජයනාත්,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
ප්‍රාදේශීය ලේකම් කාර්යාලය,<br>
පිටබැද්දර.

2013 ජූලි මස 29 වැනි දින,<br>
පිටබැද්දර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 561

---

## ශුද්ධි පත්‍රිකාව

### ඉඩම් අත්කර ගැනීමේ පනත (460 වැනි පරිච්ඡේදය)

7 වැනි වගන්තිය යටතේ දැන්වීම

*මගේ අංකය* : ම /සං/3/226.

වර්ෂ 2011 ක් වූ අගෝස්තු මස 10 වැනි දින අංක 1718/17 දරන ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ *අතිවිශෂ ගැසට් පත්‍රයේ* පළකරන ලද දැන්වීමේ සඳහන් මූලික පිඹුරු අංකය ගම් 3810 දරන පිඹුරේ කැබලි අංක 283 සහ 291 කැබලි අංක 331, 332, 333, 334 වශයෙන් සංශෝධනය විය යුතු බව මෙයින් දැනුම් දී සිටිමු.

**කැබලි අංක 331**

ඉඩමේ නම: කලහගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 15-20 පමණ වයසැති පොල් ගස් එකක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. ඒ. කුලරත්න, අංක 94, මංගල මාවත, ඉහළ කරගහමුණ, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.1035

**කැබලි අංක 332**

ඉඩමේ නම: කලහගහවත්ත; විස්තරය: ගල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. ඒ. කුලරත්න, අංක 94, මංගල මාවත, ඉහළ කරගහමුණ, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0234

**කැබලි අංක 333**

ඉඩමේ නම: කලහගහවත්ත; විස්තරය: ගල; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. ඒ. ජයරත්න, අංක 111, මංගල මාවත, ඉහළ කරගහමුණ, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.0199

**කැබලි අංක 334**

ඉඩමේ නම: කලහගහවත්ත; විස්තරය: ගෙවත්ත, අවු. 10-15 පමණ වයසැති පොල් ගස් එකක් සහ අවුරුදු 20-25 පමණ වයසැති කජු ගස් එකක් ඇත; හිමිකම් කියන අය: රජය; මුල් හිමිකම් කියන අය: ඩී. ඒ. ජයරත්න, අංක 111, මංගල මාවත, ඉහළ කරගහමුණ, කඩවත; ප්‍රමාණය: හෙක්. 0.2199

ඉහත සඳහන් ඉඩමට හිමිකම්, අයිතිවාසිකම් හෝ වෙනත් සම්බන්ධකම් කියා සිටින සියලුදෙනාම තම තමන් හෝ ඔවුන්ගෙන් ලියවිලිවලින් බලය ලත් අයවලුන් 2013 අගෝස්තු මස 15 වැනි දින පෙ. ව. 10.00ට මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී මා සම්මුඛ විය යුතු ය.

තව ද, 2013 අගෝස්තු මස 08 වැනි දිනට මත්තෙන් ඒ ඉඩම / ඉඩම් සම්බන්ධයෙන් ඔවුන්ගේ අයිතිවාසිකම්වල ස්වභාවයත්, එකී ඉඩම ලබාගැනීම ගැන වන්දි ඉල්ලීමට ඇති කරුණු පිළිබඳ විස්තරත්, වන්දි මුදල හා එම මුදල ගණන් බැලූ හැටිත් මා වෙත පිටපත් දෙකක් සහිත වූ ලියවිල්ලකින් දැනුම් දිය යුතු ය.

තමරා ඩී. පෙරේරා,<br>
ප්‍රාදේශීය ලේකම්,<br>
මහර.

2013 ජූලි මස 20 වැනි දින,<br>
මහර ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ දී ය.

08 - 562

---

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.